# Social Responsibilities & Ethics (Part-III)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

**<u>ආචාර ධර්ම යනු</u>**

ව්‍යාපාර තමන් සමග කටයුතු කරන සියලු පාර්ශ්වවලට යහපතක් සිදු වන ආකාරයට හොඳ නරක පිළිබඳ අවබෝධයෙන් කටයුතු කිරීම, ව්‍යාපාර ආචාර ධර්ම ලෙස හැඳින්විය හැකි ය.

## <u>ව්‍යාපාර ආචාර ධර්ම පිළිපැදීම ව්‍යාපාරවලට වැදගත් වන ආකාරය</u>

- ගුණාත්මක භාණ්ඩ හා සේවා සැපයීම තුළින් ගනුදෙනුකරුවන්ට සාධාරණය ඉටු වන අතර එමගින් ව්‍යාපාර පිළිබඳ ඔවුන්ගේ විශ්වාසය ඉහළ යාම

- අලෙවිකරණයට අදාළ ආචාරධර්ම පිළිපැදීම තුළින් ව්‍යාපාරයේ පැවැත්ම

- තහවුරු වීම සහ තරගකාරිත්වයට සාර්ථක ලෙස මුහුණ දිය හැකි වීම

- ගිණුම්කරණ කටයුතුවලට අදාළ ආචාරධර්ම පිළිපැදීමෙන් ව්‍යාපාරය තුළ සිදු විය හැකි මූල්‍ය අක්‍රමිකතා, විෂමාචාර පිටු දැකීම තුළින් විශ්වාසය තහවුරු වීම

- සේව්‍ය සේවක අයිතීන් හා යුතුකම් සුරකින ආචාරධර්ම තුළින් සේවකයින්ට ජාති, කුල, ආගම්

ClassWork.LK

හෝ ස්ත්‍රී/පුරුෂ ආදී වශයෙන් සිදු වන අසාධාරණකම් සිදු නො වීමෙන් මනා මානව සම්පත් කළමනාකරණයක් සිදු වීම

## **ආචාරධර්ම පද්ධතිය /ආචාර ධර්ම සංග්‍රහය**

ව්‍යාපාරය සඳහා සකස් කරන ලද ආචාරධර්ම ලිඛිත ව දැක් වූ විට එය ආචාරධර්ම පද්ධතිය /ආචාර ධර්ම සංග්‍රහය ලෙස හඳුන්වයි.

## **ව්‍යාපාර ආචාර ධර්ම පද්ධතියක් ගොඩනැගීමේ සැලකිලිමත් විය යුතු කරුණු**

- ව්‍යාපාරය
- ගනුදෙනුකරු
- සේවකයා
- තරගකරුවන්
- සමාජ සංස්කෘතිය
- සංවිධාන සංස්කෘතිය
- ප්‍රායෝගික බව

ClassWork.LK

## ව්‍යාපාරය :

ව්‍යාපාරයේ ස්වභාවය කුමක් ද ? භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාරයක් ද ? සේවා සපයන ව්‍යාපාරයක් ද ? කුඩා පරිමාණ ව්‍යාපාරයක් ද ? මහා පරිමාණ ව්‍යාපාරයක් ද? ආදිය සැලකිල්ලට ගැනීම

## ගනුදෙනුකරු

ගනුදෙනුකරුගේ ඉල්ලුම් රටා, සන්නිවේදනය, ආගමික සමාජ හා සංස්කෘතීන්ට අදාළ කරුණු පිළිබඳව සැලකිල්මත් වීම

## සේවකයා

කුමන මට්ටමේ සේවකයෙක් ද ? ඔවුන්ගේ පරිසරය, අවශ්‍යතා හා වුවමනා පිළිබඳ සැලකිලිමත් වීම

## තරඟකරුවන්

තරඟකරුවන් සිටී ද? ඔවුන් අනුගමනය කරන ආචාරධර්ම මොනවා ද ? ආදිය පිළිබඳ ව සැලකිලිමත් වීම

## සමාජ සංස්කෘතිය

ජනවර්ගය තුළ මුල් බැසගත් සංස්කෘතික සාරධර්ම හා අගනාකම් උප සංස්කෘතීන් ගැන සැලකිලිමත් වී ආචාර ධර්ම පද්ධතිය සැකසීම

ClassWork.LK

## <u>සංවිධාන සංස්කෘතිය</u>

ව්‍යාපාරය තුළ පවතින චාරිත්‍ර වාරිත්‍ර, වටිනාකම්, පුරුදු, ආකල්ප යනාදිය පිළිබඳ ව සැලකිලිමත් වීම

## <u>ප්‍රායෝගික බව</u>

ආචාරධර්ම පද්ධති සකස් කිරීමේ දී එම ආචාරධර්ම ප්‍රායෝගික ව ක්‍රියාත්මක කිරීමට හැකියාව ඇත් ද යන්න පිළිබඳ ව සැලකිලිමත් වීම

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති

## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura